
නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමේ ක්‍රියාවලිය



05.1 හැඳින්වීම

නොපවරා ගැනීමේ සහතිකය යනු කිසියම් නිශ්චල දේපළක් පළාත් පාලන ආයතනයකට පවරා ගැනීමට තත්ත්වයක් උද්ගත වී නොමැති බවට නිකුත් කරනු ලබන සහතිකයකි. කිසියම් නිශ්චල දේපළක් පළාත් පාලන ආයතනයකට පවරා ගැනීමට සිදුවන්නේ පළාත් පාලන ආයතනයට නිශ්චල දේපළ තහනම් කිරීමට අදාළ වන ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවකදීය.

ඒ නිශ්චල දේපළ පළාත් පාලන ආයතනයකට අත්පත් කරගෙන විකිණීමෙන් හිඟ මුදල අය කර ගනු ඇත. යම් සංවර්ධන කාර්යයක් සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය හා මෙහි සම්බන්ධතාවක් නැත. කෙසේ වුවද මේ සහතිකය නිකුත් කිරීමෙන් පසු එහි වලංගු කාලය නිකුත් කළ දින සිට මාස 6ක උපරිමයට යටත් වේ.

නොපවරා ගැනීමේ සහතිකය අවශ්‍ය වන්නේ යම් තැනැත්තෙකු විසින් තම දේපළ උකසට හෝ ඇපයට තබා ණය මුදලක් ඉල්ලුම්කරන අවස්ථාවක ණය නිකුත් කරනු ලබන මූල්‍ය ආයතනය විසින් කරනු ලබන දැන්වීම අනුවය.

05.2 නෛතික අධිකාරිය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158, 159, 161, 162, 163, 164, 165 සහ 166 වගන්ති.

(ආ) කලින් කලට නිකුත් කර ඇති අදාළ වන සංශෝධන, වක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා, නියෝග, සහ උපදෙස්.

05.3 සුදුසුකම්

(අ) දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරු විය යුතුය, නැතහොත් නිත්‍යානුකූල අයිතිකරු විසින් ඇටෝර්නි බලපත්‍රයක් මඟින් බලය ලැබූ තැනැත්තෙකු විය යුතුය.

(ආ) සහතිකය ඉල්ලුම් කරන දින වන විට සභාවට අය විය යුතු නිශ්චල දේපළ තහනම් කිරීමට අදාළ වන සියලුම මුදල්, ගෙවා අවසන් කර තිබිය යුතුය.

05.4 ගාස්තු

පළාත් පාලන ආයතනය විසින් කලින් කල තීරණය කර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් අය කරනු ලැබේ. මෙය පළාත් පාලන කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් මාලාව අනුව කටයුතු කළ යුතුය.

05.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

ඉල්ලුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය ඇති තැනැත්තා වන විට, මෙහි ඇමුණුම් අංක 01 හි දැක්වෙන ආකෘතියට අනුව පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් සමඟ එහි නියම කර ඇති ලේඛන.

ඉල්ලුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකාරත්වය ඇති තැනැත්තා නොවන විට ඉහත ආකාරයෙන් වූ ලිඛිත ඉල්ලීමක් සමඟ පහත ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(අ) නීත්‍යානුකූල හිමිකරු විසින් බලය දෙන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික කළ පිටපත.

(ආ) අදාළ ඇටෝර්නි බලපත්‍රය නිකුත් කළ තැනැත්තා ජීවත්ව සිටින බවට සහ ඉල්ලුම් කරන දිනය වන තෙක්ම, ඒ ඇටෝර්නි බලපත්‍රය කවර හෝ ආකාරයකින් අවලංගු කර නොමැති බවට ඇටොර්නි බලපත්‍ර ලාභියා විසින් ප්‍රකාශ කරන ලද දිවුරුම් සහතිකයක්.

05.6 කාර්යය පටිපාටිය

පටිපාටිය	කාල සීමාව	වගකීම
ඉල්ලුම් පත්‍රය භාර ගැනීම		පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි
පළාත් පාලන ආයතනයට ගෙවිය යුතුව තිබෙන නිශ්චල දේපළ තහනම් කිරීමට අදාල වන සියලුම මුදල් ගෙවා ඇති බවට තහවුරු කිරීම. මුදල්අය කර ගැනීමට ඇතිනම්, අයකර ගැනීම සහ ලදුපත නිකුත් කිරීම.	ඉල්ලුම් පත්‍රය ලැබුණු අවස්ථාවේදීම	පෙරටු කාර්යාල නිලධාරි / ආදායම් විෂය භාර නිලධාරි / ලේකම්
නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමට අනුමැතිය දීම.	ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනම	ලේකම් / විෂය භාර නිලධාරි
නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීම.	ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනම	ලේකම් / විෂය භාර නිලධාරි

සටහන:- නොපවරා ගැනීමේ සහතිකය, පහත ඇමුණුම පරිදි නිකුත් කරනු ලැබේ.

නොපවරා ගැනීමේ සහතිකය ඉල්ලුම් කිරීමට උපදෙස්

පහත සඳහන් උපදෙස් අනුව අයදුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කරන්න.

1. අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතුය. (ඡායා පිටපත් ඉදිරිපත්කිරීමේදී පරීක්ෂා කිරීම සඳහා මුල්පිටපත ඉදිරිපත් කළ යුතුය)

   (අ) ඉඩමට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක්.
   (ආ) ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්මේ (පිඹුරු පත) පිටපතක්.
   (ඇ) කිසියම් බැංකුවකින් ණයක් ලබාගෙන තිබීමේ හේතුව මත දේපළට අදාළ ඔප්පුවේ සහ පිඹුරුපතෙහි (මිනින්දෝරු සැලැස්මෙහි) මුල් පිටපතඒ බැංකුවෙහි රඳවා තබාගෙන ඇති අවස්ථාවක, අදාළ බැංකුවේ කළමණාකරු විසින් සහතික කරනලද ඒවායෙහි පිටපත් ඉදිරිපත් කළ යුතුය.
   (ඈ) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

2. ඉඩමේ අයිතිය නොපවරා ගැනීමේ සහතිකය ලබා ගන්නා තැනැත්තාට හිමි නොවේනම් ඉහත ඉල්ලුම් පත්‍රයේ අනු අංක 6 සහ 7 කොටස් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමට අදාළ ඉල්ලුම් පත්‍රය භාර දෙනු ලබන අවස්ථාවේදී, පහත (අ) සිට (ඉ) දක්වා වන ගාස්තු ගෙවා තිබිය යුතුය. (ආ) සිට (ඉ) දක්වා වන හිඟ මුදල් ප්‍රමාණය පෙරටු කාර්යාල නිලධරයා විමසා දැනගත හැකිය.

   (අ) නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමේ ගාස්තුව
   (ආ) රජය මඟින් නියම කරන ලද බදු මුදල් (ඇත්නම්)
   (ඇ) හිඟ වරිපනම් / අක්කර බදු (වරෙන්තු ගාස්තු සමඟ)
   (ඈ) හිඟ ජල සැපයුම් ගාස්තු (ප්‍රමාද ගාස්තු ඇත්නම්, ඒ සමඟ)
   (ඉ) අපද්‍රව්‍ය බැහැර කිරීමේ හිඟ ගාස්තු (හිඟ)
   (ඊ) හිඟ කර්මාන්ත බදු / ව්‍යාපාර බදු
   (උ) වෙනත්

4. ඉහත උපදෙස් අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පෙරටු කාර්යාල නිලධරයාට භාර දී ලදුපතක් ලබා ගන්න.